**සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල අරමුදල - 2016**
------------------------------------------------------------------------

සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව 2014 අංක 16 දරන සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල පනතේ 10 (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල අරමුදල් පනතේ 10 (3) වගන්තිය ප්‍රකාර ඉදිරිපත් කළ යුතු 2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ අරමුදලේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**
------------------------------------------------------------------

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**2. මූල්‍ය ප්‍රකාශන**
-----------------

**2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
-----------------------------------

2014 අංක 16 දරන සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල පනතේ 10 (3) වගන්තිය අනුව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු 2016 වර්ෂය සඳහා වූ අරමුදලේ මූල්‍ය ප්‍රකාශන 2017 දෙසැම්බර් 20 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**2.2 ගිණුම් පොත්පත් හා ලේඛන පවත්වා ගැනීම**
--------------------------------------------------

අරමුදලේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන ගොස් තිබුණද සමාලෝචිත වර්ෂයට අදාළ ගිණුම් පොත්පත් සහ ලේඛන සම්පූර්ණ කර නොතිබුණි.

**2.3 වත්කම් හා වගකීම් වල පැවැත්ම**
------------------------------------------

අරමුදල විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2015 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දක්වේ.

| **වත්කම්, ආදායම් සහ වියදම්** | **වටිනාකම** |
| --- | --- |
| | රු. |
| ස්ථාවර තැන්පතු | 15,747,770 |
| මහා භාරකාර දෙපාර්තමේන්තුවේ භාරය | 6,488,627 |
| ඉතිරි කිරීමේ ගිණුම | 10,377,786 |
| ජංගම ගිණුම | 203,785 |
| සංචිත අරමුදල | 31,276,248 |
| මුළු ආදායම | 13,057,766 |
| මුළු වියදම | 11,516,045 |
| අතිරික්තය | 1,541,721 |

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| **නීති රීති සහ රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 395 (ඇ) | බැංකු ගිණුමක් ඇති සෑම දෙපාර්තමේන්තුවක් විසින්ම එක් එක් මාසය අවසානයේ දී ඇති ගණුදෙනු සම්බන්ධයෙන් ඊලග මාසයේ 15 වෙනි දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කළ යුතු වුවත් අරමුදල විසින් බැංකු සැසඳුම් ප්‍රකාශ සකස් කර නොතිබුණි. |
| (ආ) 2005 දෙසැම්බර් 19 දිනැති අංක පීඊඩී/33 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සියලුම රාජ්‍ය ආයතනවල ආයෝජන රාජ්‍ය බැංකුවල පමණක් සිදුකළ යුතු වුවත්, ආයතනය විසින් දිගු කාලයක සිට රු.5,495,000 ක් පෞද්ගලික බැංකුවක ස්ථාවර තැන්පත් ගිණුමක ආයෝජනය කර තිබුණි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය ශාසනාරක්ෂක බල මණ්ඩල වෙත අලෙවිය සඳහා ලබා දෙන ලද කොඩි සංඛ්‍යාවෙන් අලෙවි කළ සහ ඉතිරි වූ ප්‍රමාණය නිවැරදිව ගණනය කිරීමේ ක්‍රමවේදයක් ඉකුත් වර්ෂයේදී මෙන්ම 2016 වර්ෂයේ දී ද හඳුනාගෙන නොතිබුණි. එම නිසා වර්ෂය තුළ ඉතිරි කිරීමේ ගිණුමට බැර කර තිබූ රු.19,185,496 ක මුදලින් 2016 වර්ෂයට අදාළ අලෙවි ආදායම නිශ්චිතව හඳුනා ගැනීමට නොහැකි විය.

(ආ) සමාලෝචිත වර්ෂයේදී වෛද්‍යාධාර වශයෙන් රු.1,843,000 ක් දහම්පාසල් ගුරුවරුන් සඳහා ලබා දී තිබුණද, ආධාර ලබන ගුරුවරුන් ජීවත්වන බවට ග්‍රාමසේවා සහතික සහ ආධාර ලද බවට ලබන්නාගෙන් සනාතන ලබාගෙන නොතිබුණි.

### 3.2 කාර්ය මණ්ඩල පරිපාලනය

අරමුදලේ ගිණුම් කටයුතු හා ලේඛන පවත්වා ගැනීම සඳහා එක් නිලධාරිනියක් පමණක් බඳවා ගෙන තිබීම හේතුවෙන්, අභ්‍යන්තර පරීක්ෂාවක් ඇතිවන පරිදි රාජකාරි බෙදීමක් සිදුවී නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 ක්‍රියාකාරි සැලැස්ම

සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල පනතේ සඳහන් අරමුණු ලඟාකරගත හැකි වන ආකාරයට සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර නොතිබුණි.

### 4.2 අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 (ආ) සහ 2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (1) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාර අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

### 4.3 වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම

2014 අංක 16 දරන සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩල අරමුදල පනතේ 11 වන වගන්තිය ප්‍රකාරව මණ්ඩලය විසින් වාර්ෂික වාර්තාව සකස් කර බුද්ධශාසන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙතද, ස්වේච්ඡා සමාජසේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා වෙතද ඉදිරිපත් කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු  අරමුදලේ සභාපතිගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | (i) ලෙජර් ගිණුම් පැහැදිලිව, නිවැරදිව හා විධිමත්ව පවත්වා ගෙන ගොස් නොතිබීම.<br>(ii) ජංගම ගිණුමෙන් කරන ලද වියදම් සඳහා මුදල් පොතක් හා ගෙවීම් වවුචර විධිමත්ව  පිළියෙල කර නොතිබීම.<br>(iii) ලද ආදායම් සඳහා ලදුපත් නිකුත් කර නොතිබීම.<br>(iv) මුදල් පොත නිශ්චිත කාලපරිච්ඡේදයකට වරක් තුලනය නොකිරීම. |
| (ආ) සැලසුම්කරණය | පනතේ සඳහන් අරමුණු ලඟාකරගත හැකි වන ආකාරයට වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර නොතිබීම. |
| (ඇ) ලේබල් මුද්‍රණය හා විකිණීම | මුද්‍රණය කරන ලද ලේබල් සඳහා අනු අංක යොදා නොතිබීම හා, නොවිකිණි ඉතිරි වූ ලේබල් ආපසු භාර ගැනීම, වාර්තා කිරීම, ලද හා ලැබිය යුතු ආදායම් නිවැරදිව ගණනය කිරීම සඳහා ක්‍රමවේදයක් නොතිබීම. |